**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මැයි 17 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 11 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|---|
| (i) | ප්‍රජා මූල සංවිධානයක ජල නල පද්ධතියක් සැකසීම සඳහා සභා අරමුදලින් දරන ලද රු.1,099,999ක් ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම ජලනල පද්ධතියේ අයිතිය පිළිබඳ සොයා බලා ජර්නල් සටහන් මගින් වත්කම්වලින් ඉවත් කිරීමට කටයුතු කෙරේ. |
| (ii) | අක්‍රීය ජංගම ගිණුම් 03ක රු.1,414,146ක් වර්ෂ ගණනාවක සිට ගිණුම්වලින් අත්හැරී තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | මේ පිළිබඳව වෙනත් හෙළිදරව් කිරීම් මගින් වාර්තා කර ඇත. |
| (iii) | ලීබඩු හා සවිකිරීම් රු.853,406ක් ඉඩම් හා ගොඩනැගිලි ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | විගණනයේ පෙන්වාදීම අනුව සංශෝධනය කිරීමට කටයුතු කෙරේ. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගන්නා ලද රු.875,959ක ලීබඩු හා උපකරණ තොගයක්, යන්ත්‍ර හා උපකරණ ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කෙරේ. |

| | | | |
|---|---|---|---|
| (v) | සමාලෝචිත වර්ෂයේ සේවකයින් 29කගෙන් ලද ඇප රු.25,150ක්, ආයෝජනය නොකර සේවක ඇප ආයෝජන ගිණුමට හර කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම සේවක ඇප ආයෝජන ගිණුම්වල උපචිත කොට මේ වන විට ආයෝජනය කර පියවීමට කටයුතු කොට ඇත. |
| (vi) | සභාව සතු හා සභාව විසින් භුක්ති විදින ඉඩම් හා ගොඩනැගිලි 128ක් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | අදාළ දේපළ පවරාගෙන ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතු වේ. | සභාව සතු ඉඩම් සියල්ල අළුතින් ප්‍රත්‍යාගණනය කිරීමට අවධානය යොමු කර ඇති බව කාරුණිකව දන්වමි. |
| (vii) | ඉකුත් වර්ෂයේ ණයහිමියන් ලෙස ගිණුම්ගත කළ සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් වූ රු.30,948,825ක ඉදිකිරීම් 20ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | එම වියදම් සියල්ල ජර්නල් සටහන් මගින් ප්‍රාග්ධනිත කර 2020 ගිණුම මගින් විගණනයට වාර්තා කරමි. |
| (viii) | ඉකුත් වර්ෂයේ ලැබිය යුතු පරිසර බලපත්‍ර තැන්පත් රු.508,375ක් සමාලෝචිත වර්ෂය වන විටත් ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ලෙස ගිණුම්වල දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම පරිසර බලපත්‍ර වටිනාකම මේ වන විට ආදායමට ගලපා ඇත. |
| (ix) | වටිනාකම රු.27,784ක් වූ ගබඩා තොග අයිතම 05ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම අත්හැරීම් ජර්නල් සටහන් මගින් ගැලපීමට කටයුතු කෙරේ. |
| (x) | රු.57,400ක් වූ ටයර් 08ක් ගිණුම්වල වැඩිපුර දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම අත්හැරීම් ජර්නල් සටහන් මගින් ගැලපීමට කටයුතු කෙරේ. |
| (xi) | සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ජර්නල් සටහන් 05ක් ගිණුම්වල දක්වා නොතිබුණි. | ගිණුම පිළියෙල කිරීමේ ප්‍රධාන ජර්නල් සටහන් දැක්විය යුතු වේ. | විගණනය පෙන්වා දී ඇති ජර්නල් සටහන් 2020 වර්ෂයේදී නිවැරදිව හෙළිදරව් කිරීමට කටයුතු කෙරේ. |

**(ආ) නොසැසඳුනු පාලන ගිණුම්**

**-----------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ගිණුම් විෂයයන් 10ක ශේෂයන් හා ප්‍රා.ස.19 අනුව ශේෂයන් අතර රු.64,685,438ක වෙනස්කම් විය. | ලේඛන හා උප ලේඛන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රා.ස 19 මගින් වර්ෂයේ සත්‍ය ආදායම පෙන්නුම් කළද මූල්‍ය ප්‍රකාශ මගින් බිල්කළ (උපචිත) ආදායම් පෙන්නුම් කෙරෙන බැවින් එකී වෙනස සිදු වී ඇත. |
| (ii) | ගෙවිය යුතු දෑ තුල ඇති වෙනත් ගෙවිය යුතු දෑ නැමති ලෙජර ගිණුමේ ආරම්භක ශේෂය හා ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය අතර රු.196,452ක වෙනසක් විය. | දෝෂ නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | විගණනය පෙන්වා දීම පිළිගනිමි. මෙය ආරම්භක ශේෂය ලෙජරයට පිටපත් කිරීමේදී සිදු වී ඇති දෝෂයකි. |

**(ඇ) පොත්පත් හා ලේඛන නොපැවැත්වීම**

**--------------------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | පිළියෙල කළ ගිණුම් තුල ආදායම් වියදම් ගිණුමක් පිළියෙල කර නොතිබුණි. | අදාළ ගිණුම් ලෙජරය තුල පෙන්විය යුතු වේ. | ප්‍රධාන ලෙජරයේ පෙන්නුම් නොකළද පරිගණක මාධ්‍යයෙන් ආදායම් වියදම් ගිණුමක් පිළියෙල කර ඉදිරිපත් කර ඇත. |
| (ii) | ප්‍රාදේශීය සභාව විසින් ප්‍රා.ස. ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණු අතර, ප්‍රධාන ලෙජරයේ දැක්විය යුතු ආදායම් වියදම් ගිණුම හා වෙනත් ලෙජර ගිණුම් පිළියෙල කර නොතිබුණි. | අදාළ ලේඛන යාවත්කාලීනව පවත්වා ගත යුතු අතර, ප්‍රධාන ලෙජර ගිණුම් පවත්වා ගත යුතු වේ. | උප කාර්යාල මට්ටමින් ප්‍රා.ස. ලේඛනය පිළියෙල කර ඇත. 2020 වර්ෂයේ සිට ආදායම් විෂයයන් සඳහා ගිණුම් ප්‍රධාන ලෙජරයේ පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. |

**(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් ජංගම වත්කම් තුල දීර්ඝ කාලයක සිට ලැබිය යුතු රු.150,098,398ක හඳුනා නොගත් ශේෂ 08ක් විය | හඳුනා නොගත් ශේෂයන් කඩිනමින් හඳුනා ගැනීමට හා අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම විලම්භිත අයවිය යුතු ශේෂ නිරවුල් කිරීම සඳහා කමිටුවක් මගින් කටයුතු කරමින් පවතින අතර එය සංකීර්ණ ක්‍රියාවලියක් බැවින් යම් කාලයක් ගත වුවද කඩිනමින් අවසන් කොට විගණනයට වාර්තා කරමි. |
| (ii) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගෙවිය යුතු දෑ තුල දීර්ඝ කාලයක සිට හඳුනා නොගත් රු.61,147,939ක ශේෂයක් විය. තවද රු.28,334,584ක් වූ තැන්පත් මුදලින් ආපසු ගෙවිය හැකි තැන්පත් හඳුනාගෙන ආපසු ගෙවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම ශේෂද නිරවුල් කිරීම සඳහා කමිටුවක් මගින් කටයුතු කරමින් පවතින අතර එය තරමක් සංකීර්ණ ක්‍රියාවලියක් බැවින් යම් කාලයක් ගත වුවද කඩිනමින් අවසන් කොට විගණනයට වාර්තා කරමි. |

**(ඉ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු.676,820,960ක් වූ ගිණුම් විෂයයන් 13ට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ලේඛන හා පොත් පත් යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ වන විට අදාළ ලේඛන යාවත්කාලීන කරමින් පවතී. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යනාදියට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i)128 වගන්තිය | සභාව විසින් පරිහරණය කරනු ලබන දේපළ 53ක අයිතීන් පවරාගෙන නොතිබුණි. | නීති රීති ප්‍රකාරව පවරා ගැනීම් කළ යුතු වේ. | දේපළ පවරා ගැනීමට අදාළ කටයුතු මේ වනවිට සිදු කෙරෙමින් පවතී. |
| (ii)129(2)(ඊ) වගන්තිය | ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු රු.4,572,298ක් වූ බදු කුලී හා කඩ කුලී විධිමත් පරිදි ලබාගැනීමට පියවර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | කුලී මේ වන විට නිසි ලෙස අය වෙමින් පවතී. |
| (iii)134 වගන්තිය | බල ප්‍රදේශයේ පිහිටි දියුණු ප්‍රදේශ නිශ්චිතව කලින් කලට හඳුනාගෙන නොතිබුණි. අවසන් වරට 2008 වර්ෂයේදී හඳුනාගෙන 2011 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණි. | නව ආදායම් ප්‍රභවයන් හඳුනාගැනීමට කටයුතු කළ යුතු වේ. | බල ප්‍රදේශය අළුතින් සමීක්ෂණය කිරීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුවෙමින් පවතී. |
| (iv)136 වගන්තිය | හිඟ වරිපනම් රු.3,632,922ක් සහ හිඟ අක්කර බදු රු.2,032,013ක් අය කර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතු වේ. | හිඟ අවම කර ගැනීමටද, දීර්ඝ කාලීනව අය නොවන ශේෂ සඳහා විකල්ප පියවර ගැනීමටද කටයුතු කර ඇත. |
| (v)143 වගන්තිය | ප්‍රදේශය තුල පිහිටි සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වසර 05කට වරක් තක්සේරු කර බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | නව තක්සේරුව අනුව බදු අයකිරීමට කටයුතු කළ යුතු වේ. | මේ වන විට අය කරන වරිපනම් හා නව හඳුනාගත් දේපළ සහිත ලැයිස්තුව තක්සේරුව සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. |
| (vi)159(1) වගන්තිය | සභාවට අයත් දේපළ කුලියට දීම තුල රු.4,572,298ක් වූ අයවිය යුතු මුදල් අයකර | ලැබිය යුතු ආදායම් කඩිනමින් අය කිරීමට | ගිවිසුමේ කොන්දේසි අනුව අය විය යුතු කුලී මුදල් අය කර ගැනීමට හෝ විකල්ප (නීතිමය) |

| | | | |
|---|---|---|---|
| | ගැනීම සඳහා දේපළ තහනමට ගෙන සිදුකළ යුතු ක්‍රියාමාර්ගය අනුගමනය කර නොතිබුණි. | කටයුතු කළ යුතු වේ. | ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |
| (vii)159(4) වගන්තිය | ගෙවීම් පැහැර හරින ලද ව්‍යාපාර හා කර්මාන්ත බදු සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නීති රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ වනවිට අවශ්‍ය නීතිමය පියවර ගෙන ඇත. |
| (ආ) <u>1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති</u> | | | |
| (i) අංක 5(7) රීතිය | මූල්‍ය හා ගබඩා කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි. | අභ්‍යන්තර විගණනය ශක්තිමත් කළ යුතු වේ. | මූල්‍ය ගබඩා කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් මේ වන විට සිදු කරමින් පවතී. |
| (ii) අංක 163 රීතිය | සාරාංශ ආදායම් ලේඛනය අදාළ රීති අනුව පිළියෙල කර නොතිබුණි. | අදාළ ලේඛන පවත්වා ගත යුතු වේ. | සාරාංශ ආදායම් ලේඛනය අදාල රීති අනුව පිළියෙල කිරිමට කටයුතු කර ඇත. |
| (iii)194 රීතිය | පී.එස්.45 ප්‍රකාර ඉන්වෙන්ට්‍රි ලේඛනයක් පවත්වා නොතිබුණි. | අදාළ ලේඛන පවත්වා ගත යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (iv)195 රීතිය | පාරිභෝජන ගබඩා ද්‍රව්‍ය වෙනුවෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි. | අදාළ ලේඛන පවත්වා ගත යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (v) අංක 218 රීතිය | සභාවේ සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කරවීමට කටයුතු කර නොතිබුණි. | පරීක්ෂණ මණ්ඩලයක් පත් කළ යුතු වේ. | සභාවේ සියළු ඉඩම් හා ගොඩනැගිලි පරික්ෂා කිරිම සඳහා පරික්ෂණ මණ්ඩලයක් පත් කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ, පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.133,088,555ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වූ වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.167,577,374ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

--------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු.1,414,145ක් වූ බැංකු ජංගම ගිණුම් 03ක් වර්ෂ ගණනාවක සිට අක්‍රියව පැවතුණි. | අක්‍රිය බැංකු ජංගම ගිණුම් සම්බන්ධව කඩිනමින් පියවර ගත යුතු වේ. | දැනට ව්‍යාපෘති අවසන් වී ඇති ජංගම ගිණුම් වසා දමා අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කරමින් පවතී. |

### 2.3 ආදායම් පරිපාලනය

----------------------

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------------------------------

ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| - වරිපනම් හා බදු | 18,179 | 17,325 | 9,338 | 4,542 | 15,929 | 17,025 | 18,834 | 3,765 |
| කුලී | 38,835 | 36,902 | 36,332 | 4,572 | 43,075 | 40,922 | 36,951 | 3,916 |
| බලපත්‍ර ගාස්තු | 4,250 | 1,599 | 1,599 | 508 | 4,774 | 3,960 | 3,960 | 508 |
| වෙනත් ආදායම් | 347,389 | 333,106 | 366,663 | 135,806 | 296,156 | 289,422 | 326,755 | 191,490 |
| | 408,653 | 388,932 | 413,932 | 145,428 | 359,934 | 351,329 | 386,500 | 199,679 |

* රැස්කළ ආදායම තුල සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායමෙන් රැස්කළ ආදායම සහ පසුගිය වර්ෂවල හිඟ ආදායමෙන් රැස්කළ ආදායමද ඇතුලත්ව තිබේ.

වර්ෂයේදී ප්‍රාදේශීය සභාව හිඟ රැස්කිරීම් පිළිබඳව නිවැරදිව උපයෝගී ලේඛනවල සටහන් තබා නොතිබුණි.

*පරිසර තැන්පත් මුදල් ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු ගිණුමේ දක්වා තිබුණි.

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ රුපියල් මිලියන 409ක ආදායමක් රැස් කිරීමට ඇස්තමේන්තු කර තිබුණද පෙර වර්ෂයන්ට අදාළව හිඟ ලැබීම්ද ඇතුළුව රුපියල් මිලියන 414ක් රැස්කර තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ මුළු බිල් කිරීම වූ රුපියල් මිලියන 389න් රැස්කර තිබුණේ රුපියල් මිලියන 230ක් පමණි. | ආදායම් අයකර ගැනීමට කඩිනමින් පියවර ගත යුතු වේ. | හිඟ වරිපනම් බදු හා කඩ කුලී අය කර ගැනීමටද, දීර්ඝ කාලීනව අය නොවන ශේෂ සඳහා විකල්ප (නීතිමය) පියවර ගැනීමටද කටයුතු කටයුතු කරනු ලැබේ. |

### 2.3.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වරිපනම් බිල්කිරීම් ලෙස ගිණුම්ගත කර තිබූ රු.17,324,941ක් තුල වෙනත් ආදායම් වර්ග 08ක් තිබුණු අතර වර්ෂයේ අවසාන වන විට වරිපනම් හා අනෙකුත් ආදායම් වර්ග කිහිපයක් ඇතුළුව වරිපනම් හා බදු හිඟය රු.4,541,574ක් විය. | හිඟ ආදායම් එකතු කර ගැනීමට කටයුතු කළ යුතු අතර අය නොවන හිඟ ආදායම් අය කර ගැනීමට නීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂය තුලදී වරිපනම් බදු ඇතුළු හිඟ ආදායම් අයකර ගැනීම සඳහා දේපළ තහනම් කිරීමේ වැඩසටහන් වැනි ක්‍රියාමාර්ග ගන්නා ලදී. ඉදිරියේදී සියළු හිඟ ආදායම් අයකර ගැනීමට හෝ අයකළ නොහැකි ශේෂ සම්බන්ධව විකල්ප (නීතිමය) පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

### 2.3.4 අක්කර බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළව දේපළ ඒකක 243ක් වෙනුවෙන් රු.19,031ක් අක්කර බදු බිල්කර තිබුණු අතර, වර්ෂය තුල අය කර තිබුණේ රු.9,834ක් පමණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනමින් පියවර ගත යුතු වේ. | අක්කර බදු ආදායම් අයකර ගැනීමේදී විවිධ ගැටළුවලට සභාවට මුහුණ පෑමට සිදුව ඇත. නැවත දේපළ හඳුනා ගැනීමේ සමීක්ෂණ කටයුතු ආරම්භ කර ඇති බැවින් ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව දන්වමි. |

**2.3.5 කුලී**

------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි කුලී රු.4,572,298ක් වූ අතර එය වර්ෂ 1-5 අතර කාලයකට අදාළ විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වේ. | කුලී හිඟ මුදලින් මේ වන විට සැළකිය යුතු ප්‍රමාණයක් අය කර ගැනීමට කටයුතු කර ඇත. ඉතිරි ඒවා අයකර ගැනීමට හෝ අයකළ නොහැකි ශේෂ සම්බන්ධව විකල්ප (නීතිමය) පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.37,760,755ක් හා මුද්දර ගාස්තු රු.85,302,296ක් විය. | අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වේ. | උසාවි දඩ හා මුද්දර ගාස්තු හිඟ මුදල් ගෙන්වා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති අතර මේ වන විට ඒවා කොටස් වශයෙන් අය වෙමින් පවතී. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්යසාධනය**

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව මහජනතාව වෙත සැපයිය යුතු ඉඩම් හා දේපළ, පාරවල් හා මංමාවත් වැනි සේවාවන් සැපයීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙහි බොහෝ කාරණා 1990.03.02 ගැසට් නිවේදනයේ වන සම්මත අතුරු ව්‍යවස්ථා මගින් ආවරණය වන අතර ඇතැම් කාරණා සම්බන්ධව පනත මගින් පැවරී ඇති බලතල අනුව කටයුතු කෙරේ. ආවරණය නොවන කරුණු සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පැනවීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබූ කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද එය 2014 පෙබරවාරි 17 දිනැති අංක PED/RED/01/04/2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 04 ඡේදයට අනුකූල නොවීය. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වේ. | මේ වන විට 2019 - 2022 දක්වා සිව් අවුරුදු සංවර්ධිත සැලැස්මක් සකස් කර ඇත. |

(ඇ) ප්‍රතිපාදන නොසැලසීම

-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබූ කර්තව්‍යයන් 99කින් 87ක් සඳහා පමණක් වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සලසා තිබුණි. | අදාළ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාවේ ආදායම් තත්ත්වය හා පවතින සංවර්ධන අවශ්‍යතාවල ප්‍රමුඛතාවය මත වැය වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර අවස්ථානුකූලව පෙන්වා දී ඇති කාර්යයන් සඳහාද ප්‍රතිපාදන වෙන් කිරීමට අවධානය යොමු කරමි. |

**(ඇ) අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්**

**-----------------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සිය **අරමුණුවලින් බැහැරව ක්‍රියාත්මක කල** කර්තව්‍යන් 04ක් අනාවරණය විය. | අරමුණුවලින් බැහැරව කටයුතු නොකළ යුතු වේ. | කාලීනව හඳුනාගනු ලබන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර ඒවා හැකිතාක් සභාවේ අරමුණුවලට ගැලපෙන පරිදි සිදුකිරීමට අවධානය යොමු කරනු ලැබේ. |

(

**(ඉ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

**--------------------------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ක්‍රියාකාරී සැළැස්මේ දක්වා තිබුණු විවිධ කර්තව්‍යයන් 05ක් ඉටු කිරිම සඳහා රු.1,972,000ක මුදලක් වැය කර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම් අත්පත් කරගෙන නොතිබුණි. | කර්තව්‍යයන් ඉටු කිරීමේදී අපේක්ෂිත නිමවුම් මට්ටම් කරා ළඟා වීමට කටයුතු කළ යුතු වේ. | මෙවැනි තත්ත්වයක් උද්ගත වීමට පාරිසරික / දේශපාලනික හා සමාජීය කරුණු හේතු විය. නමුත් මෙම කාර්යයන් වෙනුවෙන් වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන වැය මාරු කිරීම් මගින් අළුත් සංවර්ධන කාර්යයන් සඳහා යෙදවීමට කටයුතු කර ඇති බව කාරුණිකව පෙන්වා දෙමි. |

**(ඊ) අත්හැර දැමූ කර්තව්‍යයන්**

**-----------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට කර්තව්‍යයන් 06ක් ඉටු කිරීම සඳහා රු.10,750,000ක ප්‍රතිපාදන සලසා තිබුණද, දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගෙන අත්හැර දමා තිබුණි. | සැලසුම් සැකසීමේදී අත්‍යවශ්‍ය කාර්යයන් හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වේ. | එහිදී මෙවැනි තත්ත්වයක් උද්ගත වීමට පාරිසරික / දේශපාලනික හා සමාජීය කරුණු හේතු විය. මෙම කාර්යයන් ප්‍රතිපාදන වැය මාරු කිරීම් මගින් අළුත් සංවර්ධන කාර්යයන් සඳහා යෙදවීමට කටයුතු කර ඇති බව කාරුණිකව පෙන්වා දෙමි. |

**(උ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

**------------------------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | වර්ග කිලෝ මීටර් 168.27ක බල ප්‍රදේශයකින් සමන්විත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ | ප්‍රදේශ හා ස්ථාන සීමා කිරීමකින් තොරව කසළ එකතු | කසළ එකතු කිරීමේදී වරිපනම් ප්‍රදේශවලට අමතරව වරිපනම් නොවන ප්‍රදේශ බොහෝ |

| | | | |
|---|---|---|---|
| | කසළ එකතු කිරීම වරිපනම් ලබා ගන්නා කලාප 06කට පමණක් සීමාකර තිබුණි. සභාව සතුව කසළ බැහැර කිරීමේ ස්ථානයක් පැවතියද අදාළ ස්ථානය සඳහා පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි. සභාවේ අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානයට දිනකදී ටොන් 08ක් පමණ කසළ එක් රැස්වන අතර සභා බල ප්‍රදේශයේ වැසිකිළි අපද්‍රව්‍ය බැහැර කිරීමට සුදුසු ස්ථානයක් හඳුනාගෙන නොතිබුණි. ඒවා පෞද්ගලික ඉඩමක් වෙත මුදා හරිමින් තිබුණි. | කිරීමට කටයුතු සැලසුම් කළ යුතු වේ. | ප්‍රමාණයක් මෙහි අන්තර්ගතය. එබැවින් වරිපනම් සීමාවෙන් එපිට ප්‍රදේශවල කසළ එකතු කිරීම සිදු කරනු ලබයි. |
| (ii) | කසළ බදු අයකිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර නොතිබුණු අතර, කසළ කළමනාකරණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට පුනරාවර්තන වියදම් ලෙස රු.59,377,564ක් හා ප්‍රාග්ධන වියදම් ලෙස රු.5,000,000ක් ඇස්තමේන්තු කර තිබුණි. එම කර්තව්‍යය සඳහා පුනරාවර්තන වියදම් ලෙස රු.55,795,186ක් හා ප්‍රාග්ධන වියදම් ලෙස රු.805,165ක් වැයකර තිබුණි. | කසළ බදු අයකිරීම සඳහා ඇස්තමේන්තු සකස් කළ යුතු අතර වැය කරනු ලබන වියදම හා සසඳන කල ඉහළ ගුණාත්මක සේවාවක් ලබාදීමට කටයුතු කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂයේ කසළ ගාස්තු ඇස්තමේන්තුව අයකර ගත හැකි ගාස්තුව (2/43) යටතේ නියෝජනය වේ. කසළ කළමණාකරණය වෙනුවෙන් ඇස්තමේන්තු කළ පුනරාවර්තන හා ප්‍රාග්ධන අගයන්ට සාපේක්ෂව උද්ගත වූ අවශ්‍යතා මත අදාල වැය දරන ලදී. |

**(ඌ) තිරසර සංවර්ධන ඉලක්ක** --

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී තිබුණු අතර එම අරමුණු ළඟාකර ගැනීමේ මූලික පියවරයන් කිහිපයක් සභාව ආරම්භ කර තිබුණි. | තිරසර සංවර්ධන අරමුණුවලට අදාළ ක්‍රියාකාරකම්, ඉලක්ක හා මිනුම් දර්ශක හඳුනාගෙන අදාළ ඉලක්ක කරා ළඟාවීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) කම්මල්පත්තුව උප කාර්යාලයේ ප්‍රචාරක දැන්වීම් ආදායම් | | |
| තෝප්පුව හන්දියේ සිට කොස්ගස් හන්දිය දක්වා ප්‍රචාරක දැන්වීම් ගාස්තු අයකර නොමැති විශාල ප්‍රමාණයේ දැන්වීම් පුවරු 11ක් විය. පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2013 සැප්තැම්බර් 30 දිනැති ලිපිය පරිදි ප්‍රචාරක දැන්වීම් පුවරු ස්ථාපනය සඳහා විධිමත් කමිටුවක් පත්කර නිර්දේශ ලබා සමීක්ෂණ කටයුතු වරින්වර සිදුනොකිරීම නිසා විශාල ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | අතුරු ව්‍යවස්ථා අනුව ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඇතැම් ස්ථිර දැන්වීම් පුවරුවල හිමිකරුවන් දුරස්ථව වෙසෙන අවස්ථාවලදී ඔවුන් වෙත ලිඛිතව දන්වා චෙක්පත් මගින් ගාස්තු අයකරන අවස්ථා ඇත. මින් ඉදිරියට දැන්වීම් පුවරු ස්ථාපනය කිරීම සඳහා විධිමත් කමිටුවක් පත්කර නිර්දේශ ලබා සමීක්ෂණ කටයුතු වරින් වර සිදු කිරීමටත් අදාළ ක්‍රමවේදයන් අනුගමනය කිරීමටත් ලේඛන යාවත්කාලීන කිරීමටත් කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |
| (ආ) සංචාරක මණ්ඩල යටතේ ලියාපදිංචි හෝටල්වලින් බලපත්‍ර ගාස්තු අයකිරීම | | |
| බද්ද අය කිරීමේදී මුළු පිරිවැටුමෙන් සියයට 0.5ක් ලෙස බදු අය කිරීමට කටයුතු කර තිබුණි. බදු අය කිරීමේදී හෝටල් පරිපාලනය විසින් දන්වා එවනු ලබන පිරිවැටුම මත බදු අයකර තිබුණු අතර සභාව විසින් මෙම ආයතනවලින් විගණිත මූල්‍ය ප්‍රකාශන ලබාගෙන නොතිබුණි. විගණනය විසින් පරීක්ෂා කළ හෝටල් 02කට අදාළව අඩුවෙන් අයකර තිබුණු මුදල රු.64,025ක් විය. | අතුරු ව්‍යවස්ථා අනුව මුළු පිරිවැටුමෙන් අදාළ බදු ප්‍රතිශතය අය කළ යුතු අතර විගණිත මූල්‍ය ප්‍රකාශනවලින් දක්වා ඇති පිරිවැටුම අනුව අදාළ අය කිරීම් කළ යුතු වේ. | මේ වන විට දක්වා ඇති පරිදි කටයුතු කෙරේ. තවද මෙම හෝටල් සම්බන්ධව හිඟ මුදල් අයකර ගැනීමට නීතිමය කටයුතු කරමින් පවතී. |
| (ඇ) කර්මාන්ත පරිපාලනය | | |
| (i) කිරිමැටියාන පුස්තකාලයේ කුට්ටි ගල් ඇතිරීම | | |
| ගෙවීම් වාර්තාවේ වැඩ විෂය අංක 03 අනුව කොන්ක්‍රීට් කර්බ් 0.42m³ක් භෞතිකව | නිවැරදි මිනුම් පෙන්වීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. ඉහත මිනුම් අනුවම Form work සඳහා මිනුම්ද ගෙවීම් වාර්තාවේ මිනුම්ම |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | නිරීක්ෂණය නොවුන බැවින් රු.6,672ක් වැඩිපුර ගෙවා තිබුණු අතර කොන්ක්‍රීට් කර්බ් ප්‍රමාණයට අනුව form work සඳහා ගෙවිය හැකි බැවින් රු.7,095ක් වැඩිපුර ගෙවා තිබුණි. | | සලකා ඇත. |
| (ii) | <u>සෘජු ශ්‍රම පදනම යටතේ මාර්ග ප්‍රිමික්ස් කිරීම</u><br>සංවර්ධනය කරන අවස්ථාව වන විට සභාවට පවරා නොගත් නිවාස 01ක් හෝ 02ක් පිහිටි පෞද්ගලික පාරවල් 08ක් ප්‍රිමික්ස් යොදා සංවර්ධනය කිරීමට සහා අරමුදලින් රු.1,482,326ක් වැයකර තිබුණි. | පෞද්ගලික මාවත් සංවර්ධනය නොකළ යුතු වේ. | මාර්ග සභාවට පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සහ අනුමැතියන් සිදු වෙමින් පවතියි. |
| (ඇ) | <u>වීථි පහන් අළුත්වැඩියාව හා නඩත්තුව</u><br>වීථි පහන් අළුත්වැඩියාවන් සඳහා යොදන වීථි පහන් කණු 1852ක් සඳහා යොදන බල්බ වෙනුවෙන් රු.562,020ක් හා උපකරණ සඳහා රු.206,366ක් වැයකර තිබුණි. මෙහිදී ඉල්ලීමක් නොමැතිව හා ලේඛනයක සටහන් නොකළ වීථි පහන් 1790ක් අළුත්වැඩියා කර තිබුණි. | අළුත්වැඩියා සම්බන්ධව යාවත්කාලීනව ලේඛන පවත්වාගත යුතු වේ. | මෙම වීථි පහන් 1790 මන්ත්‍රීවරුන් විසින් පෙන්වා දුන් ස්ථානයන්හි සිදු කරනු ලැබූ අළුත්වැඩියාවන් වේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

| | <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|---|
| (අ) | කාර්මික නිලධාරි (විශේෂ) තනතුර අවුරුදු ගණනාවක සිට පුරප්පාඩුව පැවතුණි. සභාව සමාලෝචිත වර්ෂය තුලදී අනියම් හා කොන්ත්‍රාත් සේවකයින් 111ක් බඳවාගෙන සහා අරමුදලින් රු.34,355,164ක් වැයකර | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභා බල ප්‍රදේශයේ පවත්නා විශාලත්වය මත සංවර්ධන කටයුතු සඳහා සේවා ප්‍රමාණය ප්‍රමාණවත් නොවේ. කාර්යය මණ්ඩලයේ තනතුරු අළුතින් ඇති කිරීමට අනුමැතියට යවා ඇති නමුත් මෙතෙක් එම අනුමැතිය ලැබී නොමැත. |

| | | | |
|---|---|---|---|
| | තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රාථමික තනතුරුවල සේවකයින් 19 දෙනෙක් වෙනුවෙන් සභා අරමුදලින් වැයකර තිබූ රු.8,274,884ක වැටුප් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. | | |
| (ආ) | ප්‍රාදේශීය සභාව විසින් සේවක ණය ලේඛනයක් පවත්වා නොතිබීම හේතුවෙන් ඉකුත් වර්ෂවල සේවය හැර ගිය, වැඩ තහනමට ලක් කළ හා ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු සේවක ණය පිළිබඳ තොරතුරු සනාථ කරගත නොහැකි විය. | සේවක ණය ලේඛනයක් පවත්වා අදාළ තොරතුරු සියල්ල යාවත්කාලීන කළ යුතු වේ. | මේ වන විට 2018 / 2019/ 2020 සේවක ණය ලේඛන යාවත්කාලීන කර ඇත. සේවය හැර ගිය සේවක මහත්ම මහත්මින්ගේ 2020.06.20 දිනට ඇති හිඟ ශේෂ දන්වා ලිපි යවා ඇත. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් ගබඩා ස්ථාන 02ක් අනාරක්ෂිත ස්ථාන වූ අතර, තොග පාලනය පිළිබඳ අභ්‍යන්තර පරීක්ෂාවක් හෝ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. ඉන්වෙන්ට්‍රි භාණ්ඩ බෙදා හැරීම හා ලේඛනගත කිරීම දුර්වල තත්ත්වයක පැවති අතර නියැදි පරීක්ෂාවට අනුව 2016 සිට 2018 දක්වා නිලධාරීන්ට ලබා දුන් ලැප්ටොප් පරිගණක 05ක්, පෙර පාසලකට ලබා දුන් කලර් ප්‍රින්ටර් 01ක්, පුස්තකාල හා උප කාර්යාලවලට හා ක්‍රීඩාංගනවලට ලබාදුන් DELL වර්ගයේ පරිගණක 04ක්, විදුලි අංශයට ලබාදුන් ඇළුමිනියම් ඉණිමගක්, CDMA දුරකථන 20ක් හා ඩොංගල් 03ක් ඒ අතර විය. මේවා 2018 දෙසැම්බර් 31 දින සමීක්ෂණ වාර්තාවලද දක්වා නොතිබුණි. තවද 2019 | අදාළ ස්ථානය සුරක්ෂිත කිරීමට කටයුතු කළ යුතු අතර ගබඩා අභ්‍යන්තර පාලන ක්‍රමවේද ශක්තිමත් විය යුතු වේ. | දැනට ප්‍රධාන කාර්යාලයේ ගබඩා පහසුකම් සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැති බැවින් කම්මල්පත්තුව උප කාර්යාල භූමියේ ගබඩා දෙකක් පවත්වාගෙන යන අතර එහි ආරක්ෂාව සවිකර ඇති ආරක්ෂිත කැමරා පද්ධතිය මගින් ආවරණය වේ. ඉදිරියේදී විගණනය විසින් පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

වර්ෂයේ මිලදී ගත් ලැප්ටොප් 05ක් 2020 මාර්තු 02 වන විටත් ඉන්වෙන්ට්‍රිගත කර නොතිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

----------------------------

### 3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවට අයත් ඉඩම්වල ගොඩනැගිලි ඉදිකිරීමට වැයකළ වියදම පමණක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණු අතර ඉඩම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වේ. | මෙම ඉඩම්වල වර්තමාන තක්සේරු වටිනාකම ලබා ගැනීම සඳහා කඩිනමින් කටයුතු කරමි. |

### 3.5.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොවීම

---------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2016දී දීර්ඝකාලීනව බදු පදනමට පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ලබාදී තිබුණු පර්චස් 30ක් වූ බිම් කොටස වෙනුවෙන් දෙපාර්ශවය අතර බදු ගිවිසුමක් ඇති කරගෙන නොතිබුණි. | කඩිනමින් බදු ගිවිසුමක් ඇති කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධව ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලිඛිතව දැනුවත් කර ඇති බව දන්වා සිටින අතර මේ වන විට බදු ගිවිසුමට එළඹෙන ලෙස දන්වා සිහි කැඳවීමේ ලිපියක් පළාත් අධ්‍යක්ෂ වෙත යොමු කර ඇත. |

### 3.5.3 පවරා නොගත් වත්කම්

------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශය තුල පවරා නොගත් දේපළ 53ක් පවතින බව නිරීක්ෂණය වු අතර ඒ තුල කාර්යාල, පොදු වෙළඳ පොලවල්, පෙර පාසල්, පුස්තකාල හා ක්‍රීඩාංගනද විය. සමාලෝචිත වර්ෂයේදීද මෙම දේපළවල ඉදිකිරීම් හා අළුත්වැඩියාවන් සභාව | අදාළ දේපළ පවරා ගැනීම කඩිනමින් කළ යුතු වේ. | මෙම දේපළ පවරා දෙන ලෙස ප්‍රාදේශීය සභාව විසින් මීට අවස්ථා කිහිපයකදීම ඉල්ලීම් කර ඇත. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් විමසීමේදී අදාළ දේපළ සභාවට පවරාදීම සඳහා මැනුම් නියෝග පුත්තලම මිනින්දෝරු වෙත යොමු කර ඇති බව දන්වා සිටින ලදී. මේ |

| | | |
|---|---|---|
| මගින් සිදු කෙරෙමින් පැවතුණි. | | සම්බන්ධව මේ වන විටත් ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වමි. |

**3.5.4 වාර්ෂික භාණ්ඩ /තොග සමීක්ෂණය**

**--------------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මගින් විනාශ කිරීමට හා වෙන්දේසි කිරීමට නිර්දේශ කළ භාණ්ඩ පිළිබඳව කටයුතු සිදුකර ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | අපහරණය කර ගිණුම්වලින් ඉවත්කළ යුතුවේ. | 2019.12.31 දිනට අදාළව වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මගින් වෙන්දේසි කිරීමට නිර්දේශ කළ භාණ්ඩ 2020 වර්ෂයේ මාර්තු මස 06 දින සමීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ සිදු කරන ලදී. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**---------------------------------------**

**4.1 අයවැය පාලනය**

**-----------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාග්ධන වියදම් අයිතම 13ක් සඳහා රු.33,500,000ක් වෙන්කර තිබුණද ඉන් අයිතම 04ක් සඳහා රු.1,660,086ක් පමණක් වැයකර තිබුණෙන් ඉතිරිය ප්‍රතිපාදනයෙන් සියයට 95ක් විය. | ප්‍රතිපාදන උපයෝගී කරගෙන කාර්යයන් නිම කිරීම කළ යුතු වේ. | ඉදිරියේදී තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**4.2 අභ්‍යන්තර විගණනය**

**------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක19 දරන ජාතික විගණන පනතේ 30 වගන්තිය හා මු.රෙ.133(1) අනුව අභ්‍යන්තර විගණනය මගින් ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම හා කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා නිර්දේශ සකස් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය ශක්තිමත් කර එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | අභ්‍යන්තර විගණනය විසින් බොහෝ ක්ෂේත්‍ර ආවරණය කර ලබා දී තිබූ නිර්දේශයන් මේ වන විට ක්‍රියාත්මක කර ඇති අතර තව දුරටත් ක්‍රියාත්මක කර ගැනීමට ඇති නිර්දේශ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. |

## 4.3 නොවිසිඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්ති භාර අරමුදලට දායක මුදල් ගෙවීම ප්‍රමාද කිරීම මත අධිභාර ලෙස සභාව විසින් දරන ලද රු.326,355ක් අදාළ නිලධාරීන්ගෙන් අය කර ගන්නා ලෙස 2016 ඔක්තෝබර් 13 දිනැති ගිණුම්කාරක සභාව මගින් උපදෙස් ලබාදී තිබුණද, මේ දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්කාරක සභා නිර්දේශය අනුව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ දක්වා තිබූ ගිණුම්කරණ අඩුපාඩු 08ක් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | මේ වන විට ඉකුත් වර්ෂයේ පෙන්වාදී ඇති සියළු ගිණුම්කරණ අඩුපාඩු ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (ඇ) | 2016 වර්ෂයේදී ආදායම් ලෙස කපා හැර ඇති රු.30,756,510ක් සම්බන්ධයෙන් සමුච්චිත අරමුදලට කපා හළ මුදල පිළිබඳව සභාව ගත් ක්‍රියා මාර්ග විගණනයට වාර්තා නොවුණි. | වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |